මැතිවරණ කොමිෂන් සභා
03 OCT
නීති අංශය

# සර්වජන බලය ව්‍යවස්ථාව

*(සාමාජිකයන් විසින් 2024.09.19 වන දින පැවති මහා සභා රැස්වීමේදී අනුමත කරන ලදී.)*

## *I වන වගන්තිය:* නාමය සහ ලකුණ

(අ) පක්ෂයේ නාමය සර්වජන බලය වන්නේය.

(ඇ) පක්ෂයේ ලකුණ පදක්කම වන්නේය.

## *II වගන්තිය:* අරමුණු

(අ) පක්ෂයට පහත සඳහන් අරමුණු පවතින්නේය:

(අ) දීප්තිමත් පෞරාණික ශිෂ්ටාචාරයක අනන්‍ය චරිතාකම් සහ පරිචයන් තුළින් අනුප්‍රාණය රැගෙන සියල්ලන් සඳහාම වන සංවර්ධනය, ස්වෛරීත්වය සහ ප්‍රගතිය කෙරෙහි කේන්ද්‍රගත වෙමින් ශ්‍රී ලංකාව සැබෑ ලෙසම ගතික රාජ්‍යයක් බවට පත් කිරීම

(ආ) කිසිදු ආකාරයේ වෙනස් කොට සැලකීමකින් තොරව සියලු පුරවැසියන් සඳහා වන ආර්ථික සහ සමාජයීය අභිවෘද්ධිය සහතික කරන්නා වූ සාධාරණ රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම

(ඇ) වියපත්භාවයට පත් වන්නා වූ ජන සමාජය සහ අවශ්‍යතා ඇත්තවුන් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන අතරම ශ්‍රී ලංකාවේ තරුණ පිරිස සඳහා විවිධ අංශයන්හි අවස්ථාවන් නිමර්ාණය කර දීම

(ඇ) ශක්තිමත් ප්‍රාදේශීය සහ ගෝලීය අන්තර් ක්‍රියාවන් සහ බලපෑම් සමගින් ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍යය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම

## *III වගන්තිය:* දර්ශනය

සියලු පුරවැසියන් ප්‍රීතිමත්, සෞභාග්‍යමත් සහ නිදහස් භාවයෙන් යුක්තව සිටීම

### *IV වගන්තිය:* කැපවීම

(අ). පක්ෂය එහි ප්‍රතිපත්ති සැකසීමේදී පහත මූලධර්මයන් කෙරෙහි කැපවී කටයුතු කිරීම මගින් මෙහෙයවනු ලබනු ඇත්තේය:

(අ) නවෝත්පාදනය, විද්‍යාව සහ තාක්ෂණවේදය දියුණු කිරීම හරහා ව්‍යවසායකත්වය දිරි ගැන්වීම මගින් ආර්ථික සහ සමාජ දියුණුව ඇති කිරීම

(ආ) අධ්‍යාපනය, ක්‍රීඩා සහ සියලු ආර්ථික කටයුතු සඳහා සමාන අවස්ථාවන් ලබා දීම ඔස්සේ සමාජයේ සියලු ස්ථරයන් සඳහා සමාජ සචලතාව ඇති කිරීම

(ඇ) පරිසරය සහ එහි සියලු සචේතනික ජීවීන් ආරක්ෂා කිරීම

(ඈ) සමාජය තුළ අන්තර්ගතකරණය, උත්ප්‍රේක්ෂාව සහ සුබවාදය ඇති කිරීම

(ආ). පක්ෂය විසින් සෑම කල්හිදීම ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍යය සහ භෞමික අඛණ්ඩතාවය සුරක්ෂිත කරනු ලබන්නේය.

(ඇ) පක්ෂය සෑම කල්හිදීම ඒකීය ශ්‍රී ලංකාවක් වෙනුවෙන් පෙනී සිටිනු ඇත්තේය.

### *V වගන්තිය :* විධායක කමිටුව

(අ). පහත නිළධාරීන් පක්ෂයෙහි විධායක කමිටුව ලෙසින් සිටිනු ඇත්තේය:

1. ජ්‍යෙෂ්ඨ නායක
2. නායක
3. නියෝජ්‍ය නායක
4. මහ ලේකම්
5. උප ලේකම්
6. නියෝජ්‍ය ලේකම්
7. සභාපති
8. උප සභාපති (4 දෙනෙක් දක්වා)
9. භාණ්ඩාගාරික
10. උප භාණ්ඩාගාරික
11. ජාතික සංවිධායක



CamScanner

12. නියෝජ්‍ය ජාතික සංවිධායක
13. නීති ලේකම්
14. මාධ්‍ය ලේකම්
15. කමිටු සාමාජිකයින් (10 දෙනෙක් දක්වා)

(ආ) ජ්‍යෙෂ්ඨ නායකයා සහ නායකයා හැර විධායක කමිටුවේ සෙසු සියලු සාමාජිකයන් තෝරා ගැනීම, නැවත තෝරා ගැනීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම ඔවුන්ගේ තෝරා පත් කර ගැනීම/නැවත තෝරා පත් කර ගැනීම සඳහා වන යෝජනා සම්මතයකට කැමැත්ත පල කරන්නන්ගේ බහුතර ඡන්දයෙන් පක්ෂයේ උත්තරීතර මණ්ඩලය මගින් සිදු කරනු ලබන්නේය.

(ඇ). සාමාජිකයන් විසින් මෙම ව්‍යවස්ථාව සම්මත කරගත් වහාම උත්තර සභාව විසින් ජ්‍යෙෂ්ඨ නායකයා සහ නායකයා පත් කරනු ලබනු ඇත්තේය. ඉල්ලා අස්වීම හෝ මරණයට පත් වීම හේතුවෙන් නායක තනතුර පුරප්පාඩු වුවහොත් උත්තරීතර මණ්ඩලය විසින් එහි සාමාජිකයන්ගෙන් අයෙකු නායකයා වශයෙන් නම් කිරීම සහ පත් කිරීම සිදු කරනු ලබනු ඇත්තේය.

(ඈ) උත්තරීතර මණ්ඩලය විසින් සභාපති, මහ ලේකම් සහ ජාතික සංවිධායකවරයා ඉවත් කරනු ලැබිය හැක්කේ නායකයාගේ එකඟතාවය සහිතව ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්මතයක් මගින් පමණි.

(ඉ) ජාතික වැදගත්කමක් දරණ කරුණු සම්බන්ධයෙන් තීරණ ගනු ලබන අවස්ථාවකදී හෝ පක්ෂයේ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් බලපානු ලබන කරුණු සම්බන්ධව නායකයා සහ පක්ෂය තීරණ ගැනීමේ අවශ්‍යතාවය පවතින විටකදී ජ්‍යෙෂ්ඨ නායකයා විසින් නායකයා වෙත මාර්ගෝපදේශනය සහ උපදෙස් ලබා දෙනු ඇත්තේය. ජ්‍යෙෂ්ඨ නායකයා, නායකයා සමග පක්ෂයේ රැස්වීම්හි සම අසුන් දරමින් නායකයාට මාර්ගෝපදේශනය සහ උපදෙස් ලබා දෙනු ඇත්තේය.

(ඊ) නායකයා විසින් කලින් කලට වැදගත් කරුණු සඳහා ඔහු වෙත උපදෙස් ලබා දීම සඳහා මූල්‍ය, නීතිය, විද්‍යාව ආදි වශයෙන් වන ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමැත්තන් වෙනත් උපදේශකයන් වශයෙන් පත් කරනු ලැබිය හැක්කේය.

(උ) පක්ෂය විසින් එබඳු තීරණයක් ගැනීම ජාතික අවශ්‍යතාවය වෙනුවෙන් අවැසි වන විටකදී, වෙනත් දේශපාලන පක්ෂයක්/පක්ෂ සමග දේශපාලන සන්ධානයක් ඇති කර ගත යුතුද යන්න සහ/හෝ පවතින ආණ්ඩුවක් හා සමග එක් විය යුතුද යන්න උත්තර සභාව මගින් තීරණය කරනු ලබනු ඇත්තේය. සන්ධානයක් සැකසීම හෝ පක්ෂයේ තෝරා ගත් සාමාජිකයන් මගින් අමාත්‍ය තනතුරු භාර ගැනීම අන්තර්ගත වන්නා වූ පවතින ආණ්ඩුවකට එක් වීම සඳහා ගනු ලබන එබඳු කවර හෝ තීරණයක් පක්ෂ නායකයා විසින් පිටසන් කරනු ලැබිය යුත්තේය.



CamScanner

(ඌ) විධායක කමිටුවේ සහ පූර්ණය සඳහා පක්ෂ නායකයා ඇතුළුව අවම සාමාජිකයින් දහ දෙනෙක් සිටිය යුත්තේය.

## *VI වගන්තිය:* උත්තරීතර මණ්ඩලය

(අ) පක්ෂයේ උත්තරීතර මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් යුක්ත විය යුත්තේය:

I. විධායක කමිටුවේ සියලු නිළධාරීන්

II. නායකයා විසින් නම් කරනු අනෙකුත් සාමාජිකයන් 22කට නොවැඩි ප්‍රමාණයක්

(ආ) උත්තරීතර මණ්ඩලය පහත කටයුතු සඳහා වගකියනු ලැබිය යුත්තේය:

I. ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සැකසීම

II. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

III. ඡන්දයන් සඳහා සහභාගි වීම/සහභාගි නොවීම සහ කවර හෝ ඡන්දයක් සඳහා අපේක්ෂකයන් අවසාන වශයෙන් තෝරා ගැනීම සම්බන්ධ සියලු තීරණ ගැනීම

IV. පක්ෂයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන සියලු කරුණු

(ඇ) පක්ෂයේ නායකයාට ඔහු විසින් උත්තර සභාවට පත් කරනු ලැබූ කවර හෝ සාමාජිකයෙක් ඉවත් කිරීමේ අයිතිය පවතින්නේය.

(ඈ) ජාතික වැදගත්කමක් ඇති කරුණු සම්බන්ධව කලින් කලට විශේෂඥ කමිටු පත් කිරීම සඳහා උත්තරීතර මණ්ඩලයට බලය පවතින්නේය.

(ඉ) උත්තරීතර මණ්ඩලය විසින් ව්‍යවස්ථාව හා ආබද්ධ වන ආකාරයෙන් පක්ෂයේ සාමාන්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව රීති සහ රෙගුලාසි නිර්මාණය කරනු ලැබිය හැක්කේය.

## *VII වගන්තිය:* මධ්‍යම කාරක සභාව



CamScanner

(ඈ) පක්ෂයේ මධ්‍යම කාරක කමිටුව පහත සාමාජිකයන්ගෙන් සමන්විත වනු ලබන්නේය:

I. උත්තරීතර මණ්ඩලයේ සියලු සාමාජිකයන්
II. එක් එක් දිස්ත්‍රික්කය නියෝජනය කරන්නා වූ දිස්ත්‍රික් සංවිධායකයින් විසි හතර දෙනෙක් (24)
III. තාක්ෂණය, කෘෂිකර්මය, ධීවර, සංචාරක, සෞඛ්‍ය සහ අධ්‍යාපන යන ක්ෂේත්‍රයන් පහ නියෝජනය කරන්නා වූ ඒකාබද්ධ වෘත්තීය සමිති එකමුතුව වෙතින් වන නාමයෝජිතයන් හයක් (06)
IV. නායකයාගේ අනුදැනුම ඇතිව උත්තරීතර මණ්ඩලය විසින් නම් කිරීම සහ පත් කිරීම සිදු කරන්නා වූ සාමාජිකයන් විසි එකක් (21)

(ආ) උත්තරීතර මණ්ඩලය විසින් අඩු වසර ගණනක සාමාජිකත්වය සහිත කවර හෝ සාමාජිකයෙකු ව්‍යතිරේකමය අවස්ථාවන් යටතේ බඳවා ගත යුතු බවට වන මතය දරන්නේ නම් මිස කාරක කමිටුවේ සාමාජිකයන් වීම සඳහා සුදුසුකම් ලබනුයේ වසර 5කට වඩා වැඩි සාමාජිකත්වයක දරණ පුද්ගලයන් පමණක් වේ.

(ඇ) පක්ෂය විසින් කාරක කමිටුවේ ස්ත්‍රී පුරුෂ නියෝජනය සමබරව පවත්වාගෙන යාම සඳහා එහි සාමාජිකයන්ගේ යෝග්‍යතාවය රැක ගනිමින් ප්‍රමාණවත් ස්ත්‍රී නියෝජනයක් පවත්වා ගැනීමට කටයුතු කරනු ඇත්තේය.

(ඇ) එක් එක් සාමාජිකයා කාරක කමිටුවේ කොටසක් වීම සඳහා වන යෝග්‍යතාවය ඔවුන්ගේ පුද්ගලික කාර්ය සාධනයන් මත මෙන්ම පසුගිය වසර පහක කාලය තුළ පක්ෂයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දක්වන ලද දායකත්වය මත පිහිටා පුද්ගලබද්ධ වශයෙන් තක්සේරු කරනු ලබනු ඇත්තේය.

(ඉ) පක්ෂ නායකයාගේ මෙහෙයවීම මත අවම වශයෙන් මාස හයකට (06) වරක්වත් කාරක කමිටු රැස්වීම් පැවැත්වීම මහ ලේකම්වරයාගේ වගකීම වන්නේය.

(ඊ) නායකයා විසින් එසේ කිරීමට උත්තරීතර මණ්ඩලයේ වෙනත් සාමාජිකයෙකුට බලය පවරා ඇත්නම් මිස, පක්ෂ නායකයා විසින් කාරක කමිටුවේ සියලු රැස්වීම්හි මුලසුන පක්ෂ නායකයා විසින් හෙබවිය යුත්තේය.

(උ) නායකයාගේ සහභාගීත්වය නොමැතිව කාරක කමිටුවේදී ගනු ලැබූ කිසිදු තීරණයක් වලංගු නොවන්නේය.

### *VIII වන වගන්තිය:* සාමාජිකත්වය



CamScanner

67

03 OCT

# සර්වජන බලය ව්‍යවස්ථාව

*(සාමාජිකයන් විසින් 2024.09.19 වන දින පැවති මහා සභා රැස්වීමේදී අනුමත කරන ලදී.)*

## *I වන වගන්තිය:* නාමය සහ ලකුණ

(අ) පක්ෂයේ නාමය සර්වජන බලය වන්නේය.

(ආ) පක්ෂයේ ලකුණ පදක්කම වන්නේය.

## *II වගන්තිය:* අරමුණු

(අ) පක්ෂයට පහත සඳහන් අරමුණු පවතින්නේය:

(අ) දීප්තිමත් පෞරාණික ශිෂ්ටාචාරයක අනන්‍ය වටිනාකම් සහ පරිචයන් තුළින් අනුප්‍රාණය රැගෙන සියල්ලන් සඳහාම වන සංවර්ධනය, ස්වෛරීත්වය සහ ප්‍රගතිය කෙරෙහි කේන්ද්‍රගත වෙමින් ශ්‍රී ලංකාව සැබෑ ලෙසම ගතික රාජ්‍යයක් බවට පත් කිරීම

(ආ) කිසිදු ආකාරයේ වෙනස් කොට සැලකීමකින් තොරව සියලු පුරවැසියන් සඳහා වන ආර්ථික සහ සමාජයීය අභිවෘද්ධිය සහතික කරන්නා වූ සාධාරණ රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම

(ඇ) වියපත්භාවයට පත් වන්නා වූ ජන සමාජය සහ අවශ්‍යතා ඇත්තවුන් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන අතරම ශ්‍රී ලංකාවේ තරුණ පිරිස සඳහා විවිධ අංශයන්හි අවස්ථාවන් නිමර්ාණය කර දීම

(ඇ) ශක්තිමත් ප්‍රාදේශීය සහ ගෝලීය අන්තර් ක්‍රියාවන් සහ බලපෑම් සමගින් ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍යය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම

## *III වගන්තිය:* දර්ශනය

සියලු පුරවැසියන් ප්‍රීතිමත්, සෞභාග්‍යමත් සහ නිදහස් භාවයෙන් යුක්තව සිටීම



CamScanner

### *IV වගන්තිය:* කැපවීම

(අ). පක්ෂය එහි ප්‍රතිපත්ති සැකසීමේදී පහත මූලධර්මයන් කෙරෙහි කැපවී කටයුතු කිරීම මගින් මෙහෙයවනු ලබනු ඇත්තේය:

(අ) නවෝත්පාදනය, විද්‍යාව සහ තාක්ෂණවේදය දියුණු කිරීම හරහා ව්‍යවසායකත්වය දිරි ගැන්වීම මගින් ආර්ථික සහ සමාජ දියුණුව ඇති කිරීම

(ආ) අධ්‍යාපනය, ක්‍රීඩා සහ සියලු ආර්ථික කටයුතු සඳහා සමාන අවස්ථාවන් ලබා දීම ඔස්සේ සමාජයේ සියලු ස්ථරයන් සඳහා සමාජ සචලතාව ඇති කිරීම

(ඇ) පරිසරය සහ එහි සියලු සචේතනික ජීවීන් ආරක්ෂා කිරීම

(ඈ) සමාජය තුළ අන්තර්ගතකරණය, උත්ප්‍රේක්ෂාව සහ සුබවාදය ඇති කිරීම

(ආ). පක්ෂය විසින් සෑම කල්හිදීම ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍යය සහ භෞමික අඛණ්ඩතාවය සුරක්ෂිත කරනු ලබන්නේය.

(ඇ) පක්ෂය සෑම කල්හිදීම ඒකීය ශ්‍රී ලංකාවක් වෙනුවෙන් පෙනී සිටිනු ඇත්තේය.

### *V වගන්තිය :* විධායක කමිටුව

(අ). පහත නිළධාරීන් පක්ෂයෙහි විධායක කමිටුව ලෙසින් සිටිනු ඇත්තේය:

1. ජ්‍යෙෂ්ඨ නායක
2. නායක
3. නියෝජ්‍ය නායක
4. මහ ලේකම්
5. උප ලේකම්
6. නියෝජ්‍ය ලේකම්
7. සභාපති
8. උප සභාපති (4 දෙනෙක් දක්වා)
9. භාණ්ඩාගාරික
10. උප භාණ්ඩාගාරික
11. ජාතික සංවිධායක



CamScanner

12. නියෝජ්‍ය ජාතික සංවිධායක
13. නීති ලේකම්
14. මාධ්‍ය ලේකම්
15. කමිටු සාමාජිකයින් (10 දෙනෙක් දක්වා)

(ආ) ජ්‍යෙෂ්ඨ නායකයා සහ නායකයා හැර විධායක කමිටුවේ සෙසු සියලු සාමාජිකයන් තෝරා ගැනීම, නැවත තෝරා ගැනීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම ඔවුන්ගේ තෝරා පත් කර ගැනීම/නැවත තෝරා පත් කර ගැනීම සඳහා වන යෝජනා සම්මතයකට කැමැත්ත පල කරන්නන්ගේ බහුතර ඡන්දයෙන් පක්ෂයේ උත්තරීතර මණ්ඩලය මගින් සිදු කරනු ලබන්නේය.

(ඇ). සාමාජිකයන් විසින් මෙම ව්‍යවස්ථාව සම්මත කරගත් වහාම උත්තර සභාව විසින් ජ්‍යෙෂ්ඨ නායකයා සහ නායකයා පත් කරනු ලබනු ඇත්තේය. ඉල්ලා අස්වීම හෝ මරණයට පත් වීම හේතුවෙන් නායක තනතුර පුරප්පාඩු වුවහොත් උත්තරීතර මණ්ඩලය විසින් එහි සාමාජිකයන්ගෙන් අයෙකු නායකයා වශයෙන් නම් කිරීම සහ පත් කිරීම සිදු කරනු ලබනු ඇත්තේය.

(ඈ) උත්තරීතර මණ්ඩලය විසින් සභාපති, මහ ලේකම් සහ ජාතික සංවිධායකවරයා ඉවත් කරනු ලැබිය හැක්කේ නායකයාගේ එකඟතාවය සහිතව ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්මතයක් මගින් පමණි.

(ඉ) ජාතික වැදගත්කමක් දරණ කරුණු සම්බන්ධයෙන් තීරණ ගනු ලබන අවස්ථාවකදී හෝ පක්ෂයේ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් බලපානු ලබන කරුණු සම්බන්ධව නායකයා සහ පක්ෂය තීරණ ගැනීමේ අවශ්‍යතාවය පවතින විටකදී ජ්‍යෙෂ්ඨ නායකයා විසින් නායකයා වෙත මාර්ගෝපදේශනය සහ උපදෙස් ලබා දෙනු ඇත්තේය. ජ්‍යෙෂ්ඨ නායකයා, නායකයා සමග පක්ෂයේ රැස්වීම්හි සම අසුන් දරමින් නායකයාට මාර්ගෝපදේශනය සහ උපදෙස් ලබා දෙනු ඇත්තේය.

(ඊ) නායකයා විසින් කලින් කලට වැදගත් කරුණු සඳහා ඔහු වෙත උපදෙස් ලබා දීම සඳහා මූල්‍ය, නීතිය, විද්‍යාව ආදි වශයෙන් වන ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමැත්තන් වෙනත් උපදේශකයන් වශයෙන් පත් කරනු ලැබිය හැක්කේය.

(උ) පක්ෂය විසින් එබඳු තීරණයක් ගැනීම ජාතික අවශ්‍යතාවය වෙනුවෙන් අවැසි වන විටකදී, වෙනත් දේශපාලන පක්ෂයක්/පක්ෂ සමග දේශපාලන සන්ධානයක් ඇති කර ගත යුතුද යන්න සහ/හෝ පවතින ආණ්ඩුවක් හා සමග එක් විය යුතුද යන්න උත්තර සභාව මගින් තීරණය කරනු ලබනු ඇත්තේය. සන්ධානයක් සැකසීම හෝ පක්ෂයේ තෝරා ගත් සාමාජිකයන් මගින් අමාත්‍ය තනතුරු භාර ගැනීම අන්තර්ගත වන්නා වූ පවතින ආණ්ඩුවකට එක් වීම සඳහා ගනු ලබන එබඳු කවර හෝ තීරණයක් පක්ෂ නායකයා විසින් පිටසන් කරනු ලැබිය යුත්තේය.



CamScanner

(ඌ) විධායක කමිටුවේ සහ පූර්ණය සඳහා පක්ෂ නායකයා ඇතුළුව අවම සාමාජිකයින් දහ දෙනෙක් සිටිය යුත්තේය.

## *VI වගන්තිය:* උත්තරීතර මණ්ඩලය

(අ) පක්ෂයේ උත්තරීතර මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් යුක්ත විය යුත්තේය:

I. විධායක කමිටුවේ සියලු නිළධාරීන්

II. නායකයා විසින් නම් කරනු අනෙකුත් සාමාජිකයන් 22කට නොවැඩි ප්‍රමාණයක්

(ආ) උත්තරීතර මණ්ඩලය පහත කටයුතු සඳහා වගකියනු ලැබිය යුත්තේය:

I. ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සැකසීම

II. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

III. ඡන්දයන් සඳහා සහභාගි වීම/සහභාගි නොවීම සහ කවර හෝ ඡන්දයක් සඳහා අපේක්ෂකයන් අවසාන වශයෙන් තෝරා ගැනීම සම්බන්ධ සියලු තීරණ ගැනීම

IV. පක්ෂයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන සියලු කරුණු

(ඇ) පක්ෂයේ නායකයාට ඔහු විසින් උත්තර සභාවට පත් කරනු ලැබූ කවර හෝ සාමාජිකයෙක් ඉවත් කිරීමේ අයිතිය පවතින්නේය.

(ඈ) ජාතික වැදගත්කමක් ඇති කරුණු සම්බන්ධව කලින් කලට විශේෂඥ කමිටු පත් කිරීම සඳහා උත්තරීතර මණ්ඩලයට බලය පවතින්නේය.

(ඉ) උත්තරීතර මණ්ඩලය විසින් ව්‍යවස්ථාව හා ආබද්ධ වන ආකාරයෙන් පක්ෂයේ සාමාන්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව රීති සහ රෙගුලාසි නිර්මාණය කරනු ලැබිය හැක්කේය.

## *VII වගන්තිය:* මධ්‍යම කාරක සභාව



CamScanner

(අ) පක්ෂයේ මධ්‍යම කාරක කමිටුව පහත සාමාජිකයන්ගෙන් සමන්විත වනු ලබන්නේය:

I. උත්තරීතර මණ්ඩලයේ සියලු සාමාජිකයන්
II. එක් එක් දිස්ත්‍රික්කය නියෝජනය කරන්නා වූ දිස්ත්‍රික් සංවිධායකයින් විසි හතර දෙනෙක් (24)
III. තාක්ෂණය, කෘෂිකර්මය, ධීවර, සංචාරක, සෞඛ්‍ය සහ අධ්‍යාපන යන ක්ෂේත්‍රයන් පහ නියෝජනය කරන්නා වූ ඒකාබද්ධ වෘත්තීය සමිති එකමුතුව වෙතින් වන නාමයෝජිතයන් හයක් (06)
IV. නායකයාගේ අනුදැනුම ඇතිව උත්තරීතර මණ්ඩලය විසින් නම් කිරීම සහ පත් කිරීම සිදු කරන්නා වූ සාමාජිකයන් විසි එකක් (21)

(ආ) උත්තරීතර මණ්ඩලය විසින් අඩු වසර ගණනක සාමාජිකත්වය සහිත කවර හෝ සාමාජිකයෙකු ව්‍යතිරේකමය අවස්ථාවන් යටතේ බඳවා ගත යුතු බවට වන මතය දරන්නේ නම් මිස කාරක කමිටුවේ සාමාජිකයන් වීම සඳහා සුදුසුකම් ලබනුයේ වසර 5කට වඩා වැඩි සාමාජිකත්වයක දරණ පුද්ගලයන් පමණක් වේ.

(ඇ) පක්ෂය විසින් කාරක කමිටුවේ ස්ත්‍රී පුරුෂ නියෝජනය සමබරව පවත්වාගෙන යාම සඳහා එහි සාමාජිකයන්ගේ යෝග්‍යතාවය රැක ගනිමින් ප්‍රමාණවත් ස්ත්‍රී නියෝජනයක් පවත්වා ගැනීමට කටයුතු කරනු ඇත්තේය.

(ඈ) එක් එක් සාමාජිකයා කාරක කමිටුවේ කොටසක් වීම සඳහා වන යෝග්‍යතාවය ඔවුන්ගේ පුද්ගලික කාර්ය සාධනයන් මත මෙන්ම පසුගිය වසර පහක කාලය තුළ පක්ෂයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දක්වන ලද දායකත්වය මත පිහිටා පුද්ගලබද්ධ වශයෙන් තක්සේරු කරනු ලබනු ඇත්තේය.

(ඉ) පක්ෂ නායකයාගේ මෙහෙයවීම මත අවම වශයෙන් මාස හයකට (06) වරක්වත් කාරක කමිටු රැස්වීම් පැවැත්වීම මහ ලේකම්වරයාගේ වගකීම වන්නේය.

(ඊ) නායකයා විසින් එසේ කිරීමට උත්තරීතර මණ්ඩලයේ වෙනත් සාමාජිකයෙකුට බලය පවරා ඇත්නම් මිස, පක්ෂ නායකයා විසින් කාරක කමිටුවේ සියලු රැස්වීම්හි මුලසුන පක්ෂ නායකයා විසින් හෙබවිය යුත්තේය.

(උ) නායකයාගේ සහභාගීත්වය නොමැතිව කාරක කමිටුවේදී ගනු ලැබූ කිසිදු තීරණයක් වලංගු නොවන්නේය.

*VIII වන වගන්තිය: සාමාජිකත්වය*



CamScanner

(අ) පක්ෂයේ මූලධර්මයන් සහ වටිනාකම් සහ එහි ව්‍යවස්ථාව පිලිගන්නා වූ ඡන්දයකදී ඡන්දය භාවිතා කිරීමේ අයිතිය ඇත්තා වූ කවර හෝ පුරවැසියෙකුට පක්ෂ සාමාජිකයෙකු වීම සඳහා අයදුම් කිරීමට හැකියාව ඇත්තේය.

(ආ) සාමාජිකත්වය සඳහා සිදු කරනු ලබන කවර හෝ අයදුමක් එකී ප්‍රතික්ෂේප කිරීම සඳහා වන කිසිදු හේතු දැක්වීමකින් තොරව පිලිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ තනි අභිමතය පක්ෂයේ උත්තරීතර මණ්ඩලය සතු වන්නේය.

(ඇ) වාර්ෂික සාමාජික ගාස්තුව ලංකා රුපියල් 200/- ක් හෝ කලින් කලට පක්ෂයේ උත්තරීතර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන්නා වූ වෙනත් කවර හෝ ගණනක් වනු ලබන අතර එය බැංකු හුවමාරු හෝ සෘජු තැන්පතු මගින් පක්ෂය විසින් එකී අරමුණ සඳහා නම් කරන ලද පක්ෂයේ බැංකු ගිණුමට ගෙවිය යුතු වන්නේය. සාමාජිකයෙකුට ලංකා රුපියල් 5000/- ක මුදලක් ගෙවීම මගින් යාවජීව සාමාජිකත්වය ලබා ගත හැක්කේය.

(ඈ) විධායක කමිටුවේ/ උත්තරීතර මණ්ඩලයේ/කාරක කමිටුවේ ධූරයක් දරන්නා වූ කවර හෝ පුද්ගලයෙකු, ව්‍යවස්ථාවේ දක්වා ඇති ආකාරයකින් පක්ෂයේ සාමාජිකත්වය දැරීම අවසන් වුවහොත්, ස්වයංක්‍රියවම ඔවුන් ඒ ධූරයෙන් ඉවත් වීම සිදු වන්නේය.

(ඉ) පහත අවස්ථාවන්හිදී යම් පුද්ගලයෙකු පක්ෂයේ සාමාජිකත්වය දැරීම අවසන් වනු ලබනු ඇත්තේය:

(අ) මරණයට පත් වීමෙන්

(ආ) උත්තරීතර මණ්ඩලය වෙත යොමු කරනු ලැබූ ලිඛිත ඉල්ලා අස්වීමක් මගින්

(ඇ) උත්තරීතර මණ්ඩලයේ මතය පරිදි පක්ෂයේ යහපත සඳහා හානිකර වන්නා වූ කවර හෝ ක්‍රියාවකට හෝ නොකර හැරීමකට ("විෂමාචාරය") සාමාජිකයෙකු වගකිව යුතු වන්නේ නම් උත්තර සභාවේ තීරණය මගින්. එකී විෂමාචාරයන් යන්නට, පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම, පක්ෂයේ තීරණයකට එරෙහිව කටයුතු කිරීම, පක්ෂයේ තීරණ සහ/හෝ ප්‍රතිපත්ති ප්‍රසිද්ධියේ විවේචනය කිරීම, වෙනත් දේශපාලන පක්ෂයකට හෝ දේශපාලනික ස්වභාවයක් දරණ ව්‍යාපාරයකට එකතු වීම, උත්තර සභාවේ අනුමැතියකින් තොරව අමාත්‍ය මණ්ඩලයේ හෝ පලාත් සභාවේ අමාත්‍ය ධූර පිලිගැනීම, පක්ෂයේ ගරුත්වයට හානි සිදු වන ආකාරයේ කවර හෝ සමාජ විරෝධී හැසිරීමක් ප්‍රදර්ශනය කිරීම ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවන ක්‍රියාවන් අන්තර්ගත වේ.



CamScanner

(ඇ) විෂමාචාරයකදී, උත්තරීතර මණ්ඩලයේ අනුමැතිය ඇතිව අත්හිටුවීම දීර්ඝ කිරීමට යටත්ව සාමාජිකයා දින හතක (07) කාලයක් සඳහා අත්හිටුවීමේ බලය නායකයා සතු වන්නේය. සාමාජිකත්වයෙන් පහ කිරීම හෝ විනය හේතු මත වෙනත් සුදුසු විනයානුකූල පියවරයන් ගැනීම පක්ෂයේ විධායක කමිටුව විසින් පත් කරනු ලබන්නා වූ විනය කමිටුවෙහි නිර්දේශයන් මත සිදු කරනු ලබන්නේය. විනය කමිටුව විසින් සාමාජිකයා වෙත හේතු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීමෙන් අනතුරුව එහි නිගමනය වෙත පැමිණෙනු ලබන්නේය. විනය කමිටුව විසින් එහි සොයා ගැනීම් සහ නිර්දේශයන් අවසන් තීරණයක් ගැනීම සඳහා පක්ෂයේ උත්තරීතර මණ්ඩලයට ලබා දිය යුත්තේය.විනය කමිටුවේ නිර්දේශ මත වන උත්තරීතර මණ්ඩලයේ තීරණය අවසානාත්මක වන්නේය.

## *IX වගන්තිය:* මහා සභා රැස්වීම

(අ) පක්ෂයේ මහ සභා රැස්වීම් උත්තර සභාවේ ඉල්ලීම මත එයට පෙර මහා සභා රැස්වීම පැවැත්වූ දින සිට මාස පහලොවක (15) කාලයක් ඇතුලත පැවැත්විය යුතුය.

(ආ) රැස්වීම පිලිබඳ වන දැනුම් දීම ප්‍රසිද්ධ දැන්වීමක් මගින් පක්ෂයේ වෙබ් අඩවිය ඔස්සේ සියලු භාෂා ත්‍රිත්වයෙන් ජාතික පුවත්පත්හි පල කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් පල කිරීම ඔස්සේ රැස්වීම් දිනයට දින 30 කට පෙර සාමාජිකයන්ට සන්නිවේදනය කළ යුතුය.

(ඇ) දැන්වීම මගින් විධාන කර ඇති පරිදි ඔවුන්ගේ සහභාගීත්වය තහවුරු කර ඇත්තා වූ සියලු සාමාජිකයන්, මහා සභා රැස්වීමට සහභාගි වීමට සහ ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ලබයි.

## *X වන වගන්තිය:* ඡන්ද

(අ) පක්ෂය විසින් ඡන්දයක් සඳහා සහභාගි වන බවට තීරණය කරනු ලබනු අවස්ථාවකදී, කාරක කමිටුව විසින් පහත කමිටු පත් කරනු ලබන්නේය:

I. නාම යෝජනා කමිටුව
II. දේශපාලන කමිටුව

(ආ) නාම යෝජනා කමිටුව



CamScanner

(අ) නාම යෝජනා කමිටුවේ මූලික භූමිකාව වනුයේ එක් එක් ඡන්ද බල ප්‍රදේශ සඳහා පක්ෂය නියෝජනය කරමින් ඡන්ද සඳහා තරඟ කිරීමට අපේක්ෂකයින් ලැයිස්තුගත කිරීම සහ නිර්දේශ කිරීම වේ.

(ආ) නාම යෝජනා කමිටුවක් පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුත්තේය:

I. සභාපති
II. මහ ලේකම්
III. ජාතික සංවිධායක
IV. දිස්ත්‍රික් සංවිධායකවරුන් (24)

(ඇ) උත්තරීතර මණ්ඩලයෙහි විධානය පරිදි, නාම යෝජනා කමිටුව විසින් එක් එක් ඡන්ද බල ප්‍රදේශය සඳහා වන නාම යෝජනා ලැයිස්තු සකස් කර අනුමැතිය සඳහා කාරක කමිටුව වෙත භාර දිය යුත්තේය

(ඈ) පක්ෂ නායකයා විසින් නාම යෝජනා ලැයිස්තුව අවසාන වශයෙන් අත්සන් කරනු ලැබුවේ නම් මිස කිසිදු නාම යෝජනා ලැයිස්තුවක් අවසානාත්මක නොවන්නේය.

*(ඇ) දේශපාලන කමිටුව*

(අ) දේශපාලන කමිටුවේ මූලික භූමිකාව වනුයේ කාරක කමිටුව සහ අපෙක්ෂකයන් සහ එක් එක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සංවිධායකවරුන් අතර ඡන්ද ව්‍යාපාර කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ.

(ආ) දේශපාලන කමිටු රැස්වීම්හි ජාතික සංවිධායකවරයා විසින් මුලසුන දැරිය යුත්තේය.

(ඇ) දිස්ත්‍රික් සංවිධායකවරුන් සහ එක් එක් ඡන්ද දිස්ත්‍රික් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂකයා අනෙකුත් සාමාජිකයන් වේ.

## *XI වන වගන්තිය:* අනුබද්ධිත සංවිධාන

*(අ) ජාතික සංවිධාන*

(අ) සමාජයේ එක් එක් කොටස් නියෝජනය කරන්නා වූ ජාතික සංවිධානයක් පවතින්නේය. (කාන්තාවන්, ශිෂ්‍යයන්, තරුණ තරුණියන්, ගොවීන් ආදිය)

(ආ) නායකයාගේ නිර්දේශය මත එබඳු ජාතික සංවිධානයේ නායකයා පත් කරනු ලබන්නේය.



CamScanner

(ආ) දිස්ත්‍රික් සංවිධාන

(අ) එක් එක් ජාතික සංවිධාන විසින් එක් එක් ඡන්ද බල ප්‍රදේශ සඳහා ඒකාබද්ධ සංවිධානයක් පිහිටුවා ගනු ලැබිය යුත්තේය.

(ආ) එබඳු එක් එක් දිස්ත්‍රික් සංවිධානයන්හි නායකයා අදාල ජාතික සංවිධානය නියෝජනය කරනු ලැබිය යුත්තේය.

(ඇ) දැනටමත් සංගමයන් පවතින්නේ නම් (ගොවි, ධීවර හෝ වෙනත් සංගමයන්) එබඳු සංවිධානයන් උත්තර සභවේ අනුමැතිය සහිතව දිස්ත්‍රික් සංවිධාන ලෙසින් පිලිගනු ලැබිය යුත්තේය.

(ඈ) එබඳු එක් එක් දිස්ත්‍රික් සංවිධාන වලට ඡන්ද ව්‍යාපාරයෙහි හැසිරීම සම්බන්ධව වන ස්වකීය යෝජනාවන් පක්ෂයේ මහ සභා රැස්වීම වෙත යොමු කිරීමට හිමිකම් ලැබෙනු ඇත්තේය.

(ඉ) මහ සභා රැස්වීමේදී යෝජනාවක් සම්බන්ධව කටයුතු කිරීමට නම්, එම යෝජනාව මහ සභා රැස්වීම් දිනට අවම වශයෙන් දින 45කට පෙර පක්ෂයේ මහ ලේකම් වෙත ලැබිය යුත්තේය.

(ඊ) එබඳු කවර හෝ යෝජනාවක් පක්ෂයේ ප්‍රතිපත්ති සමග අනුගත විය යුත්තේය. එබඳු යෝජනාවක් උත්තරීතර මණ්ඩලය විසින් සලකා බැලීමෙන් අනතුරුව අනුමැතිය සඳහා මහ සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලබන්නේය.

(උ) යම් යෝජනාවක් පක්ෂයේ උපරිම යහපත සඳහා නොවන්නේ නම් එම යෝජනාව ප්‍රතික්ෂේප කිරීමේ බලය නායකයා සතු වන්නේය.

(ඌ) උත්තරීතර මණ්ඩලයෙහි අනුමැතිය සහිතව, මහ ලේකම් විසින් කලින් කලට අනුබද්ධ සංවිධාන පාලනය කිරීම සම්බන්ධව විධානයන් නිකුත් කරනු ලැබිය හැක්කේය.



CamScanner

## XII වගන්තිය: විනය කමිටුව

(අ) පක්ෂ සාමාජිකයන්ගේ සහ කාර්යාල සේවක මණ්ඩලයේ විනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට උත්තර සභාව මගින් පත් කරනු ලබන්නා වූ සාමාජිකයන් පස් දෙනෙකුගෙන් (05) යුක්ත විනය කමිටුවක් පවතිනු ඇත්තේය.

(ආ) උත්තරීතර මණ්ඩලය හෝ නායකයා විසින් එය වෙත යොමු කරනු ලැබුවේ නම් පමණක් විනය කමිටුව විසින් විමර්ශනයක් ආරම්භ කරනු ලබන්නේය.

(ඇ) විනය කමිටුවේ කවර හෝ සොයා ගැනීම හෝ නිර්දේශයන් නායකවරයාගේ එකඟතාවය සහිතව උත්තරීතර මණ්ඩලයෙහි තහවුරු කිරීමට යටත්ව බලාත්මක කරනු ලැබිය යුත්තේය.

## XIV වගන්තිය: ගණ පූරණය

(අ) එක් එක් මණ්ඩපය සඳහා වන ගණ පූරණය පහත පරිදි වේ:

I. උත්තරීතර මණ්ඩලය –සාමාජිකයන් 22 (නායකයාගේ සහභාගීත්වය අනිවාර්ය වේ)

II. කාරක කමිටුව – සාමාජිකයන් 20

III. විනය කමිටුව – සාමාජිකයන් 3

IV. මහ සභා රැස්වීම – සාමාජිකයන් 30

## XV වගන්තිය: මාධ්‍ය ලේකම්

(අ) නායකයාගේ නිර්දේශය මත උත්තරීතර මණ්ඩලය විසින් පක්ෂය සඳහා මාධ්‍ය ලේකම්වරයෙක් පත් කරනු ලබන්නේය. පක්ෂය විසින් අවශ්‍ය යැයි දන්වා සිටින ලද විටදී මාධ්‍ය ප්‍රකාශ සකස් කිරීම, මාධ්‍යන්ට ප්‍රකාශ නිකුත් කිරීම සහ මාධ්‍ය සාරාංශයන් සංවිධානය කිරීම මාධ්‍ය ලේකම්වරයාගේ වගකීම වන්නේය.

(ආ) පක්ෂය වෙනුවෙන් සිදු කරන්නා වූ සියලු නිල මාධ්‍ය ප්‍රකාශ නිකුත් කිරීම් පළමු වශයෙන් උත්තර සභාවෙන් අනුමත කරනු ලැබිය යුතු වන අතර නායකයාගේ අනුමැතිය මත පමණක් මාධ්‍යයට නිකුත් කරනු ලැබිය යුතුය.

(ඇ) නායකයා විසින් පක්ෂය වෙනුවෙන් මාධ්‍ය වෙත අදහස් දැක්වීම සඳහා මාධ්‍ය ප්‍රකාශකවරයෙකු පත් කරනු ලැබිය හැක්කේය.



CamScanner

(ඇ) පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශකවරයා අත්හිටුවීමේ හෝ ඉවත් කිරීමේ බලය නායකයා සතු වන අතර ඔහුට අවශ්‍ය යැයි හැඟුණහොත් ස්ථිර මාධ්‍ය ප්‍රකාශකවරයෙකු තෝරා පත් කර ගන්නා තෙක් වැඩ බලන මාධ්‍ය ප්‍රකාශකවරයෙකු තෝරා පත් කළ හැකි වන්නේය.

## *XVII වගන්තිය:* නීති ලේකම්

(අ) නායකයාගේ නිර්දේශය මත පිහිටා උත්තරීතර මණ්ඩලය විසින් පක්ෂයේ නීති ලේකම් ලෙස කටයුතු කිරීම සඳහා වෘත්තීමය වශයෙන් සුදුසුකම් සහිත සහ අත්දැකීම් සහිත නීතීඥවරයෙකු පත් කරනු ලැබිය යුත්තේය.

(ආ) නීති ලේකම්වරයා පක්ෂ නායකයා වෙත සහ උත්තරීතර මණ්ඩලය වෙත පක්ෂය හා සම්බන්ධ සාමාන්‍ය නීතිමය ගැටලු සම්බන්ධව උපදෙස් ලබා දීම සම්බන්ධව වගකිව යුතු වේ.

(ඇ) නායකයාට අවශ්‍ය නම් නීති ලේකම්වරයා ඉවත් කිරීමේ බලය පවතින අතර ඔහුට අවශ්‍ය යැයි හැඟුණහොත් ස්ථිර නීති ලේකම්වරයෙකු තෝරා පත් කර ගන්නා තෙක් වැඩ බලන නීති ලේකම්වරයෙකු තෝරා පත් කළ හැකි වන්නේය.

## *XVIII වගන්තිය:* පක්ෂයේ අරමුදල් සහ වත්කම්

(අ) පක්ෂයේ අරමුදල් දේශීය වාණිජ බැංකුවක පක්ෂයේ නමින් විවෘත කරන ලද ගිණුම් එකක හෝ වැඩි ප්‍රමාණයක තැන්පත් කරනු ලැබිය යුත්තේය.

(ආ) පක්ෂය වෙත ලැබුණා වූ කවර හෝ ප්‍රදානයක් එකී බැංකු ගිණුම් වල තැන්පත් කරනු ලැබිය යුත්තේය. පක්ෂය විසින් පිලිගනු ලබන එක් එක් ප්‍රදානය සඳහා භාණ්ඩාගාරිකවරයා විසින් රිසිට්පතක් නිකුත් කරනු ලැබිය යුත්තේය.

(ඇ) යම් ප්‍රදානයක් සුදුසු නොවන බවට ඔහුගේ මතය වන්නේ නම්, නායකයා සතුව පක්ෂය වෙත ලබා දෙනු ලැබූ කවර හෝ ප්‍රදානයක් ප්‍රතික්ෂේප කිරීමේ අභිමතය පවතින්නේය.

(ඈ) භාණ්ඩාගාරිකවරයා සහ නියෝජ්‍ය භාණ්ඩාගාරිකවරයා පක්ෂ අරමුදල් සම්බන්ධව නිසි ගිණුම් පවත්වාගෙන යාම සඳහා වගකියනු ලැබිය යුත්තේය.

(ඉ) භාණ්ඩාගාරිකවරයාගේ නිර්දේශය මත පිහිටා උත්තර සභාව විසින් පක්ෂයේ ගිණුම් විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් විගණකවරයෙකු පත් කරනු ලැබිය හැකිය.



CamScanner

(ඊ) භාණ්ඩාගාරිකවරයා විසින් විගණනය කරන ලද ගිණුම් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස 3ක කාලයක් තුළදී උත්තර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(උ) සියලු නිශ්වල සහ චංචල දේපල පක්ෂයේ නමින් දැරිය යුත්තේය.

## XIX වගන්තිය: අර්ථ නිරූපණය සහ සංශෝධනයන්

(අ) ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන් සම්බන්ධ කවර හෝ අර්ථ ව්‍යාකුල බවක් පවතී නම් උත්තරීතර මණ්ඩලය විසින් එකී විශේෂ ප්‍රතිපාදනය සඳහා පිළිගත හැකි අර්ථ නිරූපණයක් තීරණය කරනු ලැබිය හැකි වන අතර එකී අර්ථ නිරූපණය අවසානාත්මක වන්නේය.

(ආ) ව්‍යවස්ථාව සඳහා යෝජනා කරනු ලබන්නා වූ කවර හෝ සංශෝධනයක් උත්තරීතර මණ්ඩලය විසින් පළමුව අනුමත කරනු ලැබිය යුත්තේය.

(ඇ) යම් සංශෝධනයක් පක්ෂයේ උපරිම යහපත සඳහා නොවන්නේ නම් එකී සංශෝධනය නිෂේධනය කිරීමේ බලය පක්ෂ නායකයාට පවතින්නේය.

(ඈ) එලෙස අනුමත කරනු ලැබූ සංශෝධනය අවසාන වශයෙන් අනුමැතිය සඳහා මහ සභා රැස්වීම වෙත යොමු කරනු ලැබිය යුත්තේය.

\- අවසානය -



CamScanner